141

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2016/2017

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2018 නොවැම්බර්)**

## BLE 303- ශ්‍රම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. පහත ප්‍රකාශ සමඟ ඔබ එකඟවන්නේද, නැද්ද යන්න දක්වා, ඔබගේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) ශ්‍රම සාධකය සඳහා ඇත්තේ ව්‍යුත්පන්න ඉල්ලුමකි.

(ලකුණු 05)

(ආ) දිගුකාලීන ශ්‍රම ඉල්ලුම් වක්‍රය, කෙටිකාලීන ශ්‍රම ඉල්ලුම් වක්‍රයට වඩා නම්‍ය වේ.

(ලකුණු 05)

ii. ස්වයංක්‍රීය ආරක්ෂිත කැමරා පද්ධතිවල මිල ගණන් පහත වැටීම ශ්‍රම වෙළඳපල මත ඇති කරන බලපෑම න්‍යායාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. i. පහත සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

(අ) වැටුප් වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය

(ලකුණු 05)

(ආ) පුද්ගලයකුගේ ශ්‍රම සැපයුම හා රටක ශ්‍රම සැපයුම

(ලකුණු 05)

ii "පුද්ගලයෙකුගේ ශ්‍රම සැපයුම පුද්ගලික තීරණයක් වන අතර එය විවේකයේ ආවස්ථික පිරිවැය හා වැටුප මත තීරණය වේ." මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවේචන මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. i. පහත සංකල්ප අතර ඇති අන්තර් සම්බන්ධතාවය හඳුනාගන්න.

(අ) වැඩ කළ හැකි වයසේ පසුවන ජනගහනය හා ශ්‍රම හමුදාව

(ලකුණු 05)

(ආ) සේවා නියුක්ත අනුපාතය හා සේවා වියුක්ත අනුපාතය

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහල නංවා ගැනීම සඳහා කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉහල නංවා ගැනීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉහල නැංවීම සඳහා ඔබ කරන යෝජනා මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. i. ශ්‍රම වෙළඳපල තුළ සෑම ශ්‍රමිකයෙක් සඳහාම එක සමාන වැටුපක් තීරණය වන්නේ කිනම් තත්ත්වයක් යටතේද?

(ලකුණු 05)

ii. නගර පවිත්‍රතා ශ්‍රමිකයන්ට ගෙවන වැටුප අනෙකුත් කම්කරුවන්ට ගෙවන වැටුපට වඩා වැඩිය. එහෙත් එම සේවා සඳහා ඇති ශ්‍රම සැපයුම විශාල ලෙස වැඩි නොවන්නේ මන්ද යන්න න්‍යායාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii. උපාධිධාරීන් සඳහා පෞද්ගලික අංශයේ තීරණය වී ඇති වැටුප, රාජ්‍ය අංශයේ තීරණය වී ඇති වැටුපට වඩා වැඩි වුවද, උපාධිධාරීන් පෞද්ගලික අංශයෙන් ඉවත් වී රාජ්‍ය අංශයට බැඳීමේ ප්‍රවණතාවයක් දැකිය හැකිය. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති න්‍යායාත්මක හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. i. ශ්‍රී ලංකාවේ පවුල් සෞඛ්‍ය සේවය සඳහා බඳවා ගනු ලබන්නේ කාන්තාවන් පමණි. මෙය ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීමක් ලෙස හැඳින්විය හැකිද? මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල මේසන්වරුන් සඳහා තීරණය වී ඇති වැටුප නාගරික ප්‍රදේශවල එවැනි ශ්‍රමිකයන්ට ගෙවන වැටුපට වඩා අඩුය. මෙම තත්ත්වය සමතුලිත තත්ත්වයක් ලෙස පවතින්නේ මන්ද?

(ලකුණු 07)

iii. ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීමේ විවිධ ස්වරූපයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. i. "ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිතිවල සාමාජිකත්වය මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස පහත මට්ටමක පවතී." මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. තොරතුරුවල අසමමිතිකතාවයක් පැවතීම වැඩවර්ජන ඇතිවීමට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. වැටුප් ඉහල නංවා ගැනීම සඳහා වෘත්තීය සමිතිවලට අනුගමනය කළ හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07. පහත සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

i. මූර්ත වැටුප හා නාමික වැටුප
ii. අවම වැටුප හා කාර්යක්ෂම වැටුප
iii. වැටුප් වෙනස්වීමක නිමවුම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය
iv. ශ්‍රමයේ ආන්තික අයභාරය හා ශ්‍රමයේ ආන්තික නිෂ්පාදනයේ වටිනාකම

(ලකුණු 5 x 4 = මුළු ලකුණු 20)

*******